# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

## 1998 අංක 8 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1998 මාර්තු මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1998 මාර්තු මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 3.50 යි. තැපැල් ගාස්තුව : රු. 2.50 යි.

## 1998 අංක 8 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1998 මාර්තු මස 27 වන දින.]

එල්. ඩී.–ඕ. 19/95.

**1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 1998 අංක 8 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන 1980 අංක 31 දරන ස්වේච්ඡා සමාජ සේවා සංවිධාන (ලියාපදිංචි කිරීම හා අධීක්ෂණය කිරීම) පනතේ 14 වන වගන්තියට ඉක්බිතිව ම, පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, ඒ ප්‍රඥප්තියේ 14අ වගන්තිය වශයෙන් බලපැවැත්විය යුතු ය :— 1980 අංක 31 දරන පනතේ 14අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"අන්තර් කළමනාකරණ මණ්ඩලයක් පත් කිරීම.

14අ. (1) 14 වන වගන්තියේ කුමක් සඳහන් වුවද, ස්වේච්ඡා සංවිධානයකට එරෙහිව කරන ලද යම් වංචාවක් හෝ වංචාසහගත හෝ වැරදි පරිහරණයක් පිළිබඳ යම් චෝදනාවක් සනාථ කිරීම සඳහා සාක්ෂි ඇති බව 11 වන වගන්තිය යටතේ ස්ථාපනය කරන ලද පරීක්ෂණ මණ්ඩලයක් විසින් අමාත්‍යවරයා වෙත වාර්තා කරනු ලබන්නා වූ ද, වංචාව හෝ වැරදි පරිහරණය සංවිධානයේ මූල්‍ය කළමනාකරණය කෙරෙහි බලපෑමක් ඇති කරන ස්වභාවයේ එකක් බවට සහ ඒ සංවිධානය, පවත්නා විධායක කමිටුව විසින් දිගට ම පවත්වා ගෙන යාමට ඉඩ හළොත් මහජන යහපතට හානිකර වන බවට අමාත්‍යවරයා සෑහීමට පත් වන්නා වූ ද, අවස්ථාවක, ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, ඔහු විසින් ඒ ස්වේච්ඡා සංවිධානයේ කටයුතු පරිපාලනය කිරීමේ කාර්යය සඳහා අන්තර් කළමනාකරණ මණ්ඩලයක් පත් කරනු ලැබිය යුතු ය.

2—D 036747 —5,900 (97/09)

(2) (1) වන උපවගන්තිය යටතේ වූ සෑම නියමයකින් ම—

(අ) අන්තර් කළමනාකරණ මණ්ඩලයේ සාමාජිකයන්ගේ නම් දැක්විය යුතු ය ; තව ද

(ආ) එවැනි අන්තර් කළමනාකරණ මණ්ඩලයක් පත් කරන ලද්දේ යම් කාලසීමාවක් සඳහා ද ඒ කාලසීමාව සඳහන් කරනු ලැබිය යුතු අතර, ඒ කාලසීමාව සංවිධානයේ මූල්‍ය කළමනාකරණය යථා තත්ත්වයට පත් කිරීම සහතික කිරීම සඳහා අවශ්‍ය කාලසීමාව විය යුතු ය.

(3) යම් ස්වේච්ඡා සංවිධානයක් සම්බන්ධයෙන් අන්තර් කළමනාකරණ මණ්ඩලයක් පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ මණ්ඩලය විසින්, විධායක කමිටුවේ සියලු බලතල, කාර්ය සහ කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම හා ඉටු කිරීම, කරනු ලැබිය යුතු අතර, ඒ විධායක කමිටුව විසින්, ඒ අන්තර් කළමනාකරණ මණ්ඩලය පත් කරන ලද්දේ යම් කාලසීමාවකට ද ඒ කාලසීමාව තුළ දී ඒ බලතල, කාර්ය සහ කර්තව්‍ය කිසිවක් ක්‍රියාත්මක කිරීම, ඉටු කිරීම හෝ කිරීම නතර කරනු ලැබිය යුතු ය.".

වලංගු කිරීම.

3. මේ පනත ආරම්භ වීමේ දිනයට පෙරාතුව යම් ස්වේච්ඡා සංවිධානයක අන්තර් පරිපාලන කාර්යය සඳහා යම් කමිටුවක් පත් කරන ලද්දා වූ අවස්ථාවක, ඒ කමිටුව වලංගු ආකාරයෙන් පත් කරන ලද ලෙස සලකනු ලැබිය යුතු අතර, එසේ පත් කරන ලද යම් කමිටුවක් විසින් මේ පනත ආරම්භවීමේ දිනට පෙරාතුව කරන ලද සියලු ක්‍රියා, ඒ ස්වේච්ඡා සංවිධානයේ රීතිවලට අනනුකූල නොවන තාක් දුරට වලංගු ලෙස කරන ලද්දා වූ සහ කරනු ලබන්නා වූ ලෙස සලකනු ලැබිය යුතු ය. තව ද, එවැනි සෑම කමිටුවක් ම, මේ පනත ආරම්භ වූ දින සිට සහ ඉන් පසුව, ප්‍රධාන ප්‍රඥප්තියේ 14අ වගන්තිය යටතේ පත් කරන ලද අන්තර් කළමනාකරණ මණ්ඩලයක් ලෙස සලකනු ලැබිය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

4. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත් එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.